# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 45 දරන
# ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජූලි 13 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක

මිළ : ශත 80 යි          තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 45 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 41/78

**ජාතික වැවිලි කළමනාකරණ ආයතනයක් පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ වූ සහ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලසීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 45 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන දිනයක ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

## I වන කොටස

### ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සංයුතිය, අරමුණු, බලතල සහ කර්තව්‍ය

2. (1) මෙහි (මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජාතික වැවිලි කළමනාකරණ ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු අතර, 6 වන වගන්තිය යටතේ තත්කාලයෙහි ආයතනයෙහි සාමාජිකයන් වන්නා වූ තැනැත්තන්ගෙන් එය සමන්විත විය යුතු ය. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය පිහිටුවීම.

(2) (1) වන උපවගන්තියෙන් ආයතනයට දෙනු ලබන නමින්, ආයතනය සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද එහි සංස්ථා නාමයෙන් ආයතනය විසින් නඩු පැවරීම සහ ආයතනයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

(3) පාලක මණ්ඩලයේ සාමාජිකයෝ ආයතනයේ සාමාජිකයෝ වන්නාහ.

3. (1) ආයතනයේ පොදු අරමුණු— ආයතනයේ පොදු අරමුණු.

(අ) වැවිලි සේවයෙහි නියුක්ත සියලු වර්ගවලට අයත් සේවා නියුක්තයන්ට ආයතනය විසින් ම හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඇති වෙනත් ආයතන සම්බන්ධව. වැවිලි කළමනාකරණයට අදාළ පුහුණුවීමේ පහසුකම් සහ පුහුණු වීමේ වැඩමාලා සැපයීම ;

(ආ) සේවයෙහි යෙදී සිටින සේවා නියුක්තයන්ට වැවිලි කළමනාකරණය පිළිබඳ සංස්කරණ සම්මේලන සහ තත්වානුකූල කරණ පාඨමාලා සංවිධානය කිරීම ;

(ඇ) රාජ්‍ය අංශයෙහි මෙන් ම පෞද්ගලික අංශයෙහි වැවිලි සේවයේ නියුතු සේවක පිරිස් සඳහා වැවිලි කළමනාකරණය පිළිබඳ පුහුණුව සැලසීම ;

(ඈ) තේ පර්යේෂණ ආයතනය, රබර් පර්යේෂණ ආයතනය, පොල් පර්යේෂණ ආයතනය සහ එබඳු වෙනත් ආයතන යන් හා සම්බන්ධව ඩිප්ලෝමා පාඨමාලා සංවිධානය කිරීම සහ යෝග්‍ය අවස්ථාවල දී ඩිප්ලෝමා ප්‍රදානය කිරීම ;

(ඉ) වැවිලි කළමනාකරණය හා සංවර්ධනය සම්බන්ධ වූ සම්මන්ත්‍රණ හා කාර්ය සැසි සංවිධානය කිරීම හා පැවැත්වීම සහ සඟරා සහ කලාප පළ කිරීම ; සහ

(ඊ) වෙනත් සමාන ආයතනවලින් දැනටමත් විධිවිධාන සලස්වා නොමැති, වැවිලි කළමනාකරණය සහ කම්කරු සම්බන්ධතා ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පැවැත්වීම

විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් කාරණයක් හෝ සියලුම කාරණා සහ අමාත්‍යවරයා විසින් උපදෙස් සඳහා ආයතනය වෙත යොමු කරනු ලබන වෙනත් යම් කාරණයක් පිළිබඳව අමාත්‍ය වරයාට උපදෙස් දීම ආයතනයේ කාර්ය විය යුතු ය.

ආයතනයේ බලතල.

4. ස්වකීය අරමුණු හා කාර්ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ විශේෂයෙන්—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් යම් ආකාරයකින් අත්කර ගැනීම හා තබා ගැනීම, බද්දක් හෝ කුලියක් මත ගැනීම හෝ දීම හෝ උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) වැවිලි පර්යේෂණවලට අදාළ ක්ෂේත්‍ර අභ්‍යාස මධ්‍යස්ථාන සහ නියමිත ව්‍යාපෘති අත්කර ගැනීම, පිහිටුවීම, ඉදිකිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(ඇ) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍ර සහ උපකරණ ආනයනය කිරීම සහ ආයතනයේ කාර්යක්ෂම පැවැත්ම සඳහා උපකරණ, අරමුදල්, පිරිස් සහ යම් වෙනත් ආධාර භාර ගැනීම ;

(ඈ) වැවිලි සංවර්ධනයේ සියලු අංශ පිළිබඳව පර්යේෂණ පැවැත්වීමත් එවැනි පර්යේෂණ පැවැත්වීම් සම්බන්ධීකරණය කිරීම, දිරිගැන්වීම සහ ඒවාට ආධාර කිරීම ;

(ඉ) ආයතනය විසින් කරනු ලැබූ යම් සේවා සඳහා ගාස්තු හෝ අයකිරීම් නියම කිරීම ;

(ඊ) ආයතනයේ නිලධරයන් සහ සේවකයන් පත්කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම ;

(උ) ආයතනයේ සේවා නියුක්තයන් සඳහා අර්ථසාධක අරමුදල් පිහිටුවා, පවත්වාගෙන යාම සහ සුභසාධන සහ විනෝදාස්වාද පහසුකම් සැලසීම ;

(ඍ) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(එ) ආයතනයේ ව්‍යාපාරයේ කටයුතු කාර්යක්ෂමව කිරීම සඳහා පාලක මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන කටයුතු ආයතනයේ යම් සාමාජිකයකුට, අධ්‍යක්ෂවරයාට හෝ යම් සේවා නියුක්තයකුට පැවරීම

සඳහා යුක්තිසහගත ලෙස අවශ්‍ය වන්නා වූ බලතල, අයිතිවාසිකම් සහ කර්තව්‍ය ආයතනයට තිබිය යුතු ය.

අමාත්‍යවරයාගේ විධාන යටතේ ආයතනය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කළ යුතු බව.

5. ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ස්වකීය අරමුණු ඉටුකර ගැනීමේ දී ආයතනය විසින් වැවිලි සහ ඉඩම් සම්බන්ධයෙන් ආණ්ඩුවේ සාමාන්‍ය ප්‍රතිපත්තිය සහ එම ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබූ යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන අනුව කටයුතු කළ යුතු ය.

පාලක මණ්ඩලයේ සංයුතිය.

6. (1) ආයතනයට (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන)—

(අ) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්; ඔහු පාලක මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය.

(ආ) පහත දැක්වෙන නිල බලයෙන් සාමාජිකයන් වන්නා වූ එනම්—

(i) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති ;

(ii) රබර් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ;

(iii) පොල් පර්යේෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ;

(iv) කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපති ;

(v) තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ; සහ

(vi) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නාම කරන ලද යම් විශ්ව විද්‍යාලවල නියෝජිතයකු ;

(ඇ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ පහත දැක්වෙන වෙනත් සාමාජිකයන්—

(i) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ එක් නියෝජිතයකු හා වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන වෙනත් නියෝජිතයන් දෙදෙනකු ;

(ii) ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(iii) කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(iv) කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(v) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු ; සහ

(vi) කම්කරු විෂයය භාර අමාත්‍යාංශයේ නියෝජිතයකු

ගෙන් සමන්විත වන්නා වූ පාලක මණ්ඩලයක් විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් සභාපතිවරයා විමසා මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් උප සභාපතිවරයකු පත් කළ හැකි ය.

(3) (අ) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වේ නම් හෝ මන්ත්‍රීවරයෙක් වුවහොත් ; හෝ

(ආ) යම් තැනැත්තෙක් ආයතනය විසින් හෝ ඒ වෙනුවෙන් එළඹෙන ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් කෙලින් ම හෝ අන් අයුරකින් ලබන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම් ; හෝ

(ඇ) යම් තැනැත්තකුට මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තම කටයුතු තමා විසින් ඉටු කිරීමේ දී ඊට හානිකර අන්දමින් බලපෑමට ඉඩ ඇති යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇත් නම්

ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ දිගට ම කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සෙක් වන්නේ ය.

(4) (අ) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ සාමාජිකයකු මියගිය විට හෝ ඉල්ලා අස් වූ විට හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට අමාත්‍යවරයා විසින් ඒ උපවගන්තියේ ඒ ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන මිය යන හෝ ඉල්ලා අස්වන හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන සාමාජිකයා වෙනුවට වෙනත් සාමාජිකයකු පත් කළ හැකි ය.

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ යම් සාමාජිකයකු ඔහු කලින් ඉල්ලා අස්වුවහොත් හෝ මරණය හෝ ඉවත් කිරීම නිසා තම ධුරය හිස් කරනු ලැබුවහොත් හෝ මිස තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දරන්නේ ය.

(5) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ තම ධුරයෙහි කටයුතු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඒ ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට යම් තැනැත්තකු පත් කළ හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය.

7. (1) 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සෑම සාමාජිකයකු ම මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් තම ධුරය හිස් කළහොත් මිස අවුරුදු තුනක කාලයක් තුළ ධුරය දැරිය යුතු ය.

(2) නිල බලයෙන් සාමාජිකයකු වන මණ්ඩලයේ සෑම සාමාජිකයකුම ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබුවේ යම් තනතුරක් දැරීම ප්‍රකාර ද ඔහු ඒ තනතුර දරන තාක් කල් ධුරය දැරිය යුතු ය.

*මණ්ඩලයේ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයාගේ බලය.*

8. (1) 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ යම් සාමාජිකයකු ඉවත් කිරීම අවශ්‍යාවෝචිත යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නේ නම්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් හේතු නොදක්වා එසේ ඉවත් කළ හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලබන්නේ මණ්ඩලයේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද ඒ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින ඒ සාමාජිකයා විසින් ඔහුගේ ධුරය හිස් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් සාමාජිකයකු ඉවත් කරනු ලැබීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

*මණ්ඩලයේ සාමාජිකයන්ගේ ඉල්ලා අස් වීම.*

9. නිල බලයෙන් සාමාජිකයකු වන සාමාජිකයකු හැර මණ්ඩලයේ සාමාජිකයකුට අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියකින් ඕනෑම අවස්ථාවක තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

*මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසු බව.*

10. 8 වන වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලබන සාමාජිකයකු නොවන තම ධුරය අත්හැර යන යම් සාමාජිකයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

*පුරප්පාඩුවක් හෝ සාමාජිකයකුගේ පත්වීමෙහි යම් දෝෂයක් නිසා ආයතනයේ ක්‍රියා හෝ කටයුතු අවලංගු ලෙස නොසැලකිය යුතු බව.*

11. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබූ පමණින් නැතහොත් මණ්ඩලයේ යම් සාමාජිකයකුගේ පත්වීමෙහි දෝෂයක් තිබූ පමණින් ආයතනයේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත ලෙස සලකනු නොලැබිය යුතු ය.

*ආයතනයේ සාමාජිකයන්ගේ වියදම් ප්‍රතිපූරණය.*

12. ආයතනයේ සාමාජිකයන්ට යම් පාරිශ්‍රමිකයක් නොගෙවනු ලැබිය යුතු ය. එහෙත් ආයතනයේ රැස්වීම්වලට සහභාගි වීමේ කාර්ය සඳහා හෝ ආයතනය විසින් අනුමත කරනු ලබන ආයතනයේ කටයුතුවලට සම්බන්ධ වෙනත් කාර්ය සඳහා ආයතනයේ සාමාජිකයන් විසින් දරන ලද ගමන් වියදම්, හෝටල් ගාස්තු සහ වෙනත් වියදම් ආයතනය විසින් ප්‍රතිපූරණය කරනු ලැබිය යුතු ය.

*ආයතනයේ රැස්වීම.*

13. ආයතනයේ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් හා ඒ රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය සහ එම රැස්වීම්වල දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් රීති, මේ පනත යටතේ සාදනු ලැබිය හැකි ය.

*ආයතනයේ කටයුතු මණ්ඩලය විසින් පරිපාලනය කළ යුතු බව.*

14. ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම, බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම මණ්ඩලය විසින් කළ යුතු ය.

මණ්ඩලයේ බලතල සහ කාර්ය පැවරීම.

**15.** (1) මණ්ඩලයේ බලතල සහ කාර්ය සභාපතිවරයාට හෝ යම් වෙනත් සාමාජිකයකුට හෝ ආයතනයේ අධ්‍යක්ෂවරයාට හෝ මණ්ඩලයේ යම් සේවා නියුක්තයකුට මණ්ඩලය විසින් පැවරිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ බලතල හෝ කාර්ය පවරා දෙනු ලැබූ සභාපතිවරයා, වෙනත් සාමාජිකයා, අධ්‍යක්ෂවරයා හෝ සේවා නියුක්තයා විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීම හෝ කාර්ය ඉටු කිරීම මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව කළ යුතු ය.

## II වන කොටස

### ආයතනයේ අධ්‍යක්ෂවරයා සහ මණ්ඩලයේ වෙනත් නිලධරයන් හා සේවකයන් පත් කිරීම

ආයතනයේ සේවා නියුක්තයෝ.

**16.** (1) ආයතනයේ කාර්ය මණ්ඩලයට අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයකු පත් කළ හැකි අතර ඔහු එහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම හෝ කාර්ය සහ කර්තව්‍යයන් ඉටුකිරීම අධ්‍යක්ෂවරයා විසින් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ අධ්‍යක්ෂවරයා අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කළ හැකි අතර, එසේ ඉවත් කිරීම කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(4) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් සහ සේවකයන්, මණ්ඩලය විසින් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කළ හැකි ය.

ආයතනයේ කාර්ය මණ්ඩලයට කරනු ලබන පත්වීම් සම්බන්ධයෙන් මණ්ඩලයේ බලතල.

**17.** (1) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව—

(අ) ආයතනයේ කාර්ය මණ්ඩලයට නිලධරයන් පත් කිරීම, ඔවුන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය ;

(ආ) කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියම සහ කොන්දේසි නිශ්චය කිරීම ; සහ

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථසාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම සහ එවැනි යම් යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම

මණ්ඩලය විසින් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සියලුම කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් රීති මේ පනත යටතේ සාදනු ලැබිය හැකි ය.

18. (1) රජයේ සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ ඉල්ලීම පිට සහ ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්ගේ එවැනි ම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවකට මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය. ආයතනයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(4) නියමිත කාලසීමාවන් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹුණු යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ යොදවනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් සේවා කාලයක් වේ නම්, එය යට කී ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ඔහු විසින් ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාගේ හෝ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ ඒ පළාත් පාලන ආයතනයේ හෝ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවකට මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට එවැනි ම කැමැත්ත ඇතිව තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. එසේ නැතහොත් විශ්‍රාම වැටුප් හිමිකම් හෝ අර්ථසාධක අරමුදල් හිමිකම් හෝ පිළිබඳ නියම හා කොන්දේසි ද ඇතුළුව මණ්ඩලය සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ පළාත් පාලන ආයතනය හෝ අතර ගිවිස ගනු ලබන නියම සහ කොන්දේසි යටතේ එම සාමාජිකයා හෝ නිලධරයා හෝ සේවකයා හෝ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(6) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු (5) වන උපවගන්තිය යටතේ ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා යටත් වන්නේ ය.

*රජයේ සංස්ථාවල නිලධරයන් සහ සේවකයන් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.*

**19.** (1) රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ ද ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ද කැමැත්ත ඇතිව, අර්ථසාධක අරමුදල් හිමිකම් පිළිබඳ නියම හා කොන්දේසි ඇතුළුව, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ආයතනයේ පාලක මණ්ඩලය එකඟ වන නියම හා කොන්දේසි මත කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා යටත් වන්නේ ය.

*දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව ආයතනයේ නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකන බව.*

**20.** ආයතනයේ සියලු නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

*අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සලකන බව.*

**21.** ආයතනය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

## III වන කොටස

### මුදල්

*ආයතනයේ ප්‍රාග්ධනය.*

**22.** (1) ආයතනයේ ආරම්භක ප්‍රාග්ධනය මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි මත ආණ්ඩුව විසින් ආයතනයට සපයනු ලැබිය යුතු ය.

(2) විසර්ජන පනතකින් හෝ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් බලය දෙනු ලැබූ මුදලින් ආයතනයේ ප්‍රාග්ධනය කලින් කල වැඩි කරනු ලැබිය හැකි ය. ඒ මුදල් ප්‍රමාණය මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි මත, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් ආයතනයට ගෙවනු ලැබිය යුතු ය. නැතහොත් ආයතනයට ලබා ගැනීමට සැලැස්විය යුතු ය.

*1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළ කිරීම.*

**23.** 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ආයතනයේ මුදල් පාලනයට සහ ගිණුම්වලට අදාළ වන්නේ ය.

*ආයතනයේ මුදල් වර්ෂය.*

**24.** ආයතනයේ මුදල් වර්ෂය ජනවාරි මස පළමු වන දිනයෙන් ආරම්භ වන දොළොස් මසක කාලසීමාව විය යුතු ය.

## IV වන කොටස

### පොදු විධිවිධාන

25. (1) ආයතනයේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍ය වූ විට, ඒ දේපළෙහි යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන අවස්ථාවක, ඒ දේපළ අවශ්‍යව ඇත්තේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යය පොදු කාර්යයක් ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව ඒ දේපළ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගෙන ආයතනයට පවරනු ලැබිය හැකි ය. ආයතනය සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ආයතනය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් ආයතනය විසින් ගෙවිය යුතු ය.

26. (1) රජයේ යම් නිශ්චල දේපළක් ආයතනයේ යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය, රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ පිළිබඳ විශේෂ ප්‍රදානයක් කළ හැකි හෝ බද්දක් දිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ දේපළ සම්බන්ධයෙන් ආයතනය වෙත කරනු ලබන විශේෂ ප්‍රදානයකට හෝ දෙනු ලබන බද්දකට ඒ අනුව ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ වන්නේ ය. වැවිලි සහ නිශ්චල රජයේ දේපළ ආයතනයට ලබා ගත හැකි බව.

(2) රජයේ චංචල දේපළක් ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින්, අමාත්‍යවරයා විසින් ඒ දේපළ අයත් වන්නේ යම් අමාත්‍යාංශයකට ද නැතහොත් දෙපාර්තමේන්තුවකට ද එසේත් නැතහොත් ඒ දේපළෙහි සන්තකය දරන්නේ යම් අමාත්‍යාංශයක් විසින් ද නැතහොත් දෙපාර්තමේන්තුවක් විසින් ද ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නැතහොත් ඒ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ කැමැත්ත ඇතිව ඒ දේපළෙහි සන්තකය සහ පාවිච්චිය ආයතනය වෙත පවරා සතුකර දිය හැකි ය.

27. අවශ්‍ය යයි සලකනු ලබන ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පහසුකම් ආයතනය විසින් පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් විධිවිධාන සැලැස්විය යුතු ය. ස්ථාන ආදිය ආයතනයේ පාවිච්චිය සඳහා ආණ්ඩුව විසින් ලබා දිය යුතු බව.

28. (1) (අ) මේ පනත යටතේ මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව ; හෝ මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට පවරනු ලබන නඩු සඳහා ආරක්ෂාව.

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද්දේ යයි සැලකෙන හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරිය නොහැකි ය.

(2) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට හෝ තැනැත්තකු විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා විසින් දරනු ලැබූ යම් වියදමක් එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දේ යයි අධිකරණය විසින් තීරණය කරන්නේ නම්, මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට හෝ විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

29. මණ්ඩලයට විරුද්ධව පවරනු ලැබූ යම් නඩුවක දී මණ්ඩලයේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට හෝ විරුද්ධව රිට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

රීති සෑදීමට ආයතනයට ඇති බලය.

30. (1) මේ පනතින් රීති සාදනු ලැබීමට බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් ආයතනය විසින් රීති සෑදිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආයතනය විසින් සාදන ලද රීතියක්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

මණ්ඩලයට විශේෂ හෝ සාමාන්‍ය විධාන දීමට අමාත්‍යවරයාගේ බලය.

31. මණ්ඩලයේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් විශේෂ හෝ සාමාන්‍ය විධාන ලිඛිතව දිය හැකි අතර, මණ්ඩලය විසින් එම විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

අර්ථ නිරූපණය.

32. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි —

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්ද වූ හෝ පිහිටුවනු ලබන්නාවූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නාවූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.